**ඇඹිලිපිටිය නගර සභාව - 2020**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ඇඹිලිපිටිය නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල දරන ලද ප්‍රාග්ධන වියදම් රු. 2,060,720 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය තුල පුනරාවර්තන වියදම් වශයෙන් ලියාහැරීමෙන් වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය සමාන වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරිමේදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු. 1,077,223 ක් වුවද, එය රු. 900,000 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු. 177,223 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අනෙකුත් ආදායම් මෙන්ම උසාවි දඩ ආදායම ද උපචිත පදනම යටතේ ගිණුම්ගත කර ඇති බව. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කළයුතු නාගරික සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධ ගිණුමට බැර කර තිබූ රු. 2,148,630 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස හඳුනා නොගැනීමෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම එම වටිනාකමින් අඩුවෙන් ද, යථෝක්ත බැංකු ගිණුමේ ශේෂය නොදැක්වීමෙන් මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු. 869,705 ක් අඩුවෙන් ද, උක්ත ගිණුමෙන් සභාවේ පොදු ගිණුමට මාරු කර තිබුණු රු. 5,000,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල වගකීම් ලෙස ඉදිරිපත් කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ජංගම වගකීම් එම වටිනාකමින් වැඩියෙන් ද දක්වා තිබුණි. | පෙන්වා දී අති අඩුපාඩු ඉදිරි වසරේ ගිණුම පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 සැප්තැම්බර් 30 දිනැති නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛ අංක 08 හි 02 ඡේදය අනුව නාගරික සංවර්ධන බැංකු ගිණුමේ තැන්පත් කරන මුදල් වියදම් කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව සිදුනොකල යුතු වුවද, සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව රු. 5,000,000 ක් එම ගිණුමෙන් මහා සභාවේ අනුමැතිය මත පොදු ගිණුමට මාරු කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන බවත්, ඉදිරියේදී මෙම මුදල නාගරික සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 17,139,539 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 27,453,244 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 47,993,067 ක් වූ හිඟ වරිපනම් ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ ශේෂය අයකර ගැනීම සඳහා දේපල තහනම් කිරීමට අනුමැතිය ඉල්ලා මහා සභාවට ඉදිරිපත් කළ ද එයට අනුමැතිය ලබා දී නැති බව. | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කුළී** | | |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට බදුකරුවන් 93 ක ගෙන් වර්ෂ 05 කට අධික කාලයක සිට හිඟව පවත්නා එකතුව රු. 7,373,104 ක් | කොරෝනා වසංගතය හේතුවෙන් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූ අතර ඉදිරියේදී මෙම හිඟ කඩකුලී අයකර ගැනීමට | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වූ පොදු වෙළඳපල කඩකුළී, බස්නැවතුම්පල කුළී සහ වෙළඳ ස්ථාන කුළී අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබූ අතර, කඩකාමර 40 කට අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. තවද, කඩකාමර 04 කට අදාළව රු. 1,023,231 ක් අයකර ගැනීම සඳහා බදුකරුවන්ට එරෙහිව නඩු පවරා තිබුණද, සෙසු කඩකාමරවල හිඟ කුළී අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන බව. | |

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 614,591 ක් සහ මුද්දර ගාස්තු රු. 3,955,337 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් අප්‍රමාදව රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

-----------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් උත්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පදනම් කරගෙන පළාත් සභා ප්‍රතිපාදන මත රු. 2,689,200 ක් වැයකර ඩිජිටල් දැන්වීම් පුවරුවක් මිලදී ගෙන තිබුණ ද 2020 වර්ෂය තුල උපයා තිබූ ආදායම රු. 35,500 ක් වීමෙන් ව්‍යාපෘති යෝජනාවට අනුව මූලික පිරිවැය මාස 20 කින් ආවරණය කර ගැනිමේ අරමුණ ඉටුකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගත් බව හා ආදායම නොලැබීම හේතුවෙන් නැවත ප්‍රසම්පාදනය කර සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට යෝජනාවක් 2021 මැයි 28 දින පැවති මහා සභාවට යොමු කරන ලද නමුත් එම යෝජනාව ද ප්‍රතික්ෂේප වූ බව. | ව්‍යාපෘති යෝජනාව අනුව වත්කමින් අපේක්ෂිත ආදායම් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩකාමර 64 ක් සහිතව 2014 වර්ෂයේ නගර සභාව වෙත පවරා දී තිබූ ''නවනගරය පොදු වෙළඳපොළ කඩකාමර'' සභාව විසින් ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව කුළී පදනම මත බදුකරුවන් වෙත ලබාදී තිබුණි. ඒ සඳහා හිඟ කුළී රු. 734,622 ක් කපාහැරීම සඳහා 2020 පෙබරවාරි මස ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඉල්ලා තිබූ අතර, තවදුරටත් රැඳී සිටින බදුකරුවන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 675,600 ක් අයකර ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස් උපදෙස් ලබා දී තිබුණ ද, එම හිඟ මුදල් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මුද්‍රා තබන ලද කඩ කාමර 11ක් නැවත ටෙන්ඩර් කර ගිවිසුම්ගත වූ බවත්, ගිවිසුම්ගත නොවූ කඩකාමර හිමියන් සමඟ ගිවිසුම් ගතවීමට කටයුතු කරන බව. කුළී නොගෙවූ කඩහිමියන්ට විරුද්ධව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බව. | ගිවිසුම්ගත නොවූ කඩකාමර සඳහා ගිවිසුම්ගතවීමට කටයුතු කළ යුතුය. හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගතයුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ කසළ කළමනාකරණ කටයුතු සඳහා මිනි ලෝඩර් යන්ත්‍රයක් සහා අරමුදල් භාවිතා කර ඍජු මිලදී ගැනීම් ක්‍රමය යටතේ මිලදී ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ යොමු අංක BD/GPS/319/08/05 දරන 2019 දෙසැම්බර් 10 දින අනුමැතිය ලැබී තිබුණද, 2020 ජනවාරි 01 දින රු. 7,497,888 ක මුල්‍ය කල්බදු වට්නාකමකට මිලදී ගැනීම සිදුකර තිබුණි. | සභාපතිවරයා විසින් මුදල් කමිටුවේ හා මහා සභාවේ අනුමැතිය මත කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ කසළ පෙරලීම නතර වී තිබූ බැවින් අධික දුර්ගන්ධයක් ඇතිවීම මඟින් ජනතාවගෙන් විරෝධතා එල්ලවීම සලකා බලා කල්බදු ක්‍රමයට සපයා ගෙන ඇති බව. | ජාතික ප්‍රතිපත්තිවලට පටහැනිව කටයුතු නොකළ යුතුය. |